සංවර්ධන රෙගුලාසි චක්‍රලේඛ අංක 20

මගේ අංකය:- 05/2/1/10
2007 දෙසැම්බර් මස 31 දින.

සභාපති,
බේරුවල/මතුගම/වලල්ලාවිට/අගලවත්ත/බෙන්තොට/
ඇල්පිටිය/නියාගම ප්‍රාදේශීය සභාව.

**බෙන්තර ගඟ හා එය පෝෂණය වන අතු ගංගා ආශ්‍රිත කලාපය සඳහා සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.**

පාරිසරික සංවේදී බෙන්තර ගඟ අවට සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු බැවින් බෙන්තර ගඟ හා එය පෝෂණය වන අතු ගංගා වන පැලවත්ත ගඟ, පිටිගල ගඟ හා වැලිපැන්න ගඟ ප්‍රදේශවල භෞතික සංවර්ධන කාර්යයන්හිදී පහත සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය තීරණය කර ඇත. ඒ අනුව මෙම කලාපය තුළ සංවර්ධන අයදුම්පත් අනුමත කිරීමේදී හා සංවර්ධන බලපත්‍ර ලබාදීමේදී පහත කොන්දේසිවලට අනුකූලව කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි. (මෙම රෙගුලාසි නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශ තුල ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වන අතර, සෙසු ප්‍රදේශවල ද ක්‍රියාත්මක කිරීම නිර්දේශ කරනු ලැබේ.)

01. ගඟ රක්ෂිතය

1.1 සියලු ගංගා සඳහා ඒවායේ ගං ඉවුරු මායිමේ සිට මීටර් 10 ක බිම් තීරයක් ගඟ රක්ෂිතය ලෙස ඉදිකිරීම්වලින් තොරව භූදර්ශන අලංකාර කොට පාංශු ඛාදනය නොවන ආකාරයට නඩත්තු කළයුතුය.

## 02. බිම් කොටස්වලට අදාල පිරිවිතර හා ගොඩනැගිලි උස

2.1 ගං ඉවුරේ සිට මීටර් 10 - මීටර් 30 ත් අතර සීමාව තුළ අවසර දෙනු ලබන බිම් කට්ටිවල භූමි ප්‍රමාණයන් හා ගොඩනැගිලි උස පහත අයුරින් වියයුතුය.

අ. බිම් කට්ටිවල භූමි ප්‍රමාණය

| බිම් කට්ටිය | අවම භූමි ප්‍රමාණය |
|---|---|
| ගං ඉවුරේ සිට මීටර් 30 දක්වා කලාපය තුළ සිදුවන සියලුම බිම් කැබලි | පර්චස් 15 කි. (පවතින බිම් කැබලි පිළිබඳව අදාළ පළාත් පාලන ආයතනයේ සැලසුම් කමිටුව විසින් දැනට ක්‍රියාත්මක වන නියමයන්ට අනුකූලව කටයුතු කළයුතුය.) |
| මීටර් 30 න් ඔබ්බට පිහිටි ඉඩම් කැබලි | අදාළ පළාත් පාලන ආයතනය සඳහා ක්‍රියාත්මක වන රෙගුලාසිවලට අනුව කටයුතු කළයුතුය. |

ආ. ගොඩනැගිලි උස (මෙම රෙගුලාසිය අදාල වන්නේ බෙන්තර ගඟ සඳහා පමණක් වන අතර එය පෝෂණය වන අතු ගංගා සඳහා බල නොපැවැත්වේ.)

| ගඟ ඉවුරු මායිමේ සිට දුර | ගොඩනැගිල්ලේ උපරිම උස පිහිටි පොළවේ සිට |
|---|---|
| මීටර් 10 දක්වා | අවසර දෙනු නොලැබේ. |
| මීටර් 10 - මීටර් 30 දක්වා | (I) උස මීටර් 8.2 (අඩි 27) - ගොඩනැගිලි රෙගුලාසි හා අනෙකුත් අවශ්‍යතාවන් සම්පූර්ණ කර, ගඟට සමාන්තරව දිවෙන ඉඩම් මායිමේ පළලින් 1/4 ක ප්‍රමාණයක් (අවම පළල මීටර් 3.3 ක් (අඩි 10) වියයුතුය.) ගඟේ දර්ශනය අවහිර නොවන ආකාරයට ඉඩමේ එක් පසෙකින් ඉඩ තබා ඉදිකිරීම් සිදුකිරීමට පමණක් අවසර දෙනු ලැබේ. මෙම අවස්ථාවන්හිදී අදාළ ස්ථානයේ භෞතික පිහිටීම සැලකිල්ලට ගෙන උස මට්ටම් පාලනය කිරීමේ හැකියාව පිළිබඳව සැලසුම් කමිටුවට තීරණ ගැනීමට හැකිවේ.<br><br>(II) ඉහත (I) හි සඳහන් ඉඩම් මායිමේ පළලින් 1/4 ක් ගඟේ දර්ශනයට විවෘතව ඇති බිම් ප්‍රමාණය තුළ මායිම් තාප්ප ඉදිකිරීමට අවසර දෙනු නොලැබේ. එහෙත් ඒ සඳහා කම්බි දැල් වැටක් හෝ එවැනි නිමාවකින් යුත් වැටක් සඳහා අවසර දෙනු ලැබේ. |
| මීටර් 30 ට වැඩි | නාගරික සංවර්ධන අධිකාරියේ සාමාන්‍ය රෙගුලාසි බල පැවැත්වේ. |

## 03. ඉඩමේ සිදුවන භෞතික සංවර්ධනය

3.1 ගං ඉවුරට මුහුණලා පිහිටි මායිම සඳහා මායිම් තාප්ප ඉදිකිරීමට අවසර නොදෙන අතර, ඒ සඳහා කම්බි දැල් වැටක් හෝ එවැනි නිමාවකින් යුත් වැටක් සඳහා අවසර දෙනු ලැබේ.

3.2 මෙම විශේෂ කලාපය තුළ පස් කැපීම හෝ පිරවීම නොකළයුතුය. සියලු ඉදිකිරීම් ගඟ අවට පරිසර සෞන්දර්ය ගැලපෙන ආකාරයට සිදු කිරීම කළයුතුය.

3.3 ගං ඉවුරේ සිට මීටර් 10 - මීටර් 30 අතර සිදු කරනු ලබන වර්ග මීටර් 1500 ට (වර්ග අඩි 5000) අඩු නේවාසික සංවර්ධනයන් හැර අනෙකුත් සියලු සංවර්ධන කාර්යයන් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ නිරවුල් සහතිකය ලබාගතයුතුය.

3.4 නාගරික සංවර්ධන බල ප්‍රදේශ තුළ සියලු සංවර්ධන කාර්යයන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසිවලට අනුකූල වියයුතුය.

04. ස්වභාවික වෘක්ෂලතා

4.1 පවතින ස්වාභාවික වෘක්ෂලතා ආරක්ෂා කළයුතුය.

4.2 මෙම ගඟ දෙපස බහුලව පවතින ඉහළ ජෛවීය විවිධත්වයකින් යුතු කඩොලාන පරිසර පද්ධතියට කිසිදු හානියක් හෝ බාධාවක් සිදු නොකළයුතුය.

4.3 ඉහත (4.1) හා (4.2) හි සඳහන් කරුණුවලට යම් හානියක් හෝ බාධාවක් අදාල භූමිය තුල සිදුවන්නේ නම් එවැනි සංවර්ධන කටයුතු තහනම් කිරීමට සහ භාවිතය යථා තත්වයට පත් කිරීමට කටයුතු කළයුතුය.

05. අපද්‍රව්‍ය බැහැර කිරීම.

5.1 කැලිකසල අපද්‍රව්‍ය හා අපවිත්‍ර ජලය බැහැර කිරීම සඳහා අදාළ පළාත් පාලන ආයතනයේ නිර්දේශයන්ට අනුව විධිමත් ක්‍රියා පද්ධතියක් අනුගමනය කළයුතු අතර, ඒවා කිසිසේත්ම ගඟට හෝ ගඟ රක්ෂිතයට බැහැර කිරීම නොකළයුතුය.

ප්‍රසන්න සිල්වා
අධ්‍යක්ෂ ජනරාල්
නාගරික සංවර්ධන අධිකාරිය.

පිටපත්:-

01. සභාපති, නා.සං.අ. - කාරුණික දැනගැනීම සඳහා

02. සභාපති, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව - - එම -

| | | |
|---|---|---|
| 03. | සභාපති, මධ්‍යම පරිසර අධිකාරිය | - කාරුණික දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| 04. | අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව | - - එම - |
| 05. | දිස්ත්‍රික් ලේකම්, කළුතර / ගාල්ල | - කාරුණික දැනගැනීම, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව දැනුවත් කිරීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| 06. | පළාත් පාලන කොමසාරිස්, බ.ප./දකුණු පළාත | - කාරුණික දැනගැනීම හා අදාළ පළාත් පාලන ආයතන දැනුවත් කිරීමට |
| 07. | සහකාර පළාත් පාලන කොමසාරිස්, කළුතර/ගාල්ල දිස්ත්‍රික්කය | - - එම - |
| 08. | ප්‍රාදේශීය ලේකම්, බේරුවල/මතුගම/වලල්ලාවිට/ අගලවත්ත/බෙන්තොට/ඇල්පිටිය/නියාගම | - කාරුණික දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| 09. | ලේකම්, බේරුවල/මතුගම/වලල්ලාවිට/අගලවත්ත/ බෙන්තොට/ඇල්පිටිය/නියාගම ප්‍රාදේශීය සභාව | - කාරුණික දැනගැනීම, වැඩ අධිකාරි/කාර්මික නිලධාරි ඇතුලු අදාළ නිලධාරීන් දැනුවත් කිරීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| 10. | දිස්ත්‍රික් ඉංජිනේරු, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කළුතර/ගාල්ල | - කාරුණික දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| 11. | අධ්‍යක්ෂ (බ.ප.)/ දකුණු පළාත/නීති/නිර්මාණ, ව්‍යාපෘති කළමනාකරණ හා උපදේශන සේවා,නා.සං.අ. | - - එම - |
| 12. | අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ),නා.සං.අ. | - කාරුණික දැනගැනීම හා ගොනුකර තැබීම සඳහා |
| 13. | නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), නා.සං.අ. | - කාරුණික දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| 14. | පුස්තකලාධිපති, නා.සං.අ. | - කරුණාකර ගොනුකර තැබීම සඳහා |
| 15. | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)/නගර නිර්මාණ ශිල්පි/ සැලසුම් නිලධාරි/ සැලසුම් සහකාර, නා.සං.අ. | - කාරුණික දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |